# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2285/19 - 2022 ජූනි මස 24 වැනි සිකුරාදා - 2022.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය, සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ජූනි මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි ''**2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි**'' ලෙස හඳුන්වනු ලැබේ.

2. 2022 මැයි මස 31 දිනැති අංක 2282/22 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රය මගින් සංශෝධිත, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

3. 2022 මැයි 06 දිනැති අංක 2278/21 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ අංක 4 දරන රෙගුලාසිය ආදේශකර පහත පරිදි කියවිය යුතුය.

4. 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් ක්‍රම පළකරන ලද 2012 ජනවාරි මස 02 දිනැති අංක 1739/3 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ අංක 3 (I) (ආ) රෙගුලාසිය සංශෝධනය කරනු ලබන අතර විවෘත ගිණුම් ක්‍රමය හෝ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම භාවිත කිරීම සඳහා අවසර ලැබෙන්නේ;

(අ) ඔවුන්ගේ අපනයන අරමුණු සඳහා අවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා

(i) ඔවුන්ගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs) හෝ අක්වෙරළ බැංකු ඒකකයේ (OBU) පවත්වාගෙන යන ගිණුම්වල ඇති අපනයන ඉපයුම් වලින් ලද ආදායම් ;

හෝ

(ii) ඔවුන්ගේ විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්වල රඳවා ඇති ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයකුගෙන් (එනම් විදේශීය ණය දෙන්නන්) ලබා ගන්නා විදේශ මුදල් ණය;

හෝ

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ (FEA) නිකුත් කර ඇති රෙගුලාසි මගින් අවසර දී ඇති පරිදි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා (එනම් කෙටි කාලීන ණය ගැනීම්) විදේශ ණය දෙන්නන්ගෙ න් ලබාගත් ණය මුදල්;

හෝ

(iv) විදේශ විනිමය පනත යටතේ නිකුත් කර ඇති නියෝග ප්‍රකාරව ආයෝජිතයා විසින් විවෘත කර පවත්වාගෙන යන, තම විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට (SFCA) කොටස් ප්‍රාග්ධනය ලෙස, අනේවාසික ආයෝජකයින්ගෙන් ලැබුණු විදේශ ව්‍යවහාර මුදල්;

වලින් ගෙවීම් පියවන අපනයනකරුවන් සඳහා

(ආ) එම අපනයනකරුවන් සඳහා ආනයනය කර භාණ්ඩ සපයනු ලබන, විදේශ ව්‍යවහාර මුදල්වලින් ගෙවීම් ලැබ එකී සැපයුම සඳහා භාණ්ඩ ආනයනයට :

**i.** ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs) හෝ අක් වෙරළ බැංකු ඒකකයේ (OBU) පවත්වාගෙන යන ගිණුම්වෙත එසේ ලැබුණු විදේශ මුදල්;

හෝ

**ii.** ඉහත සඳහන් (අ)(ii), (iii) සහ (iv) ඡේදවල ප්‍රතිපාදන අනුව ලැබුණු විදේශ මුදල් ආදායම් වලින් ගෙවීම් පියවන දේශීය සැපයුම්කරුවන් (වක්‍ර අපනයනකරුවන්) සඳහා

(ඇ) දේශීයව එකතු කල අගය අවම වශයෙන් 30%ක් හෝ ඊට වැඩි තම නිපැයුම් නිෂ්පාදනය සඳහා, දේශීයව ලබා ගත නොහැකි නමුත් අමුද්‍රව්‍ය ලෙස අවශ්‍යවන භාණ්ඩ, ශ්‍රී ලංකාවේ ඕනෑම වරායකට / ගුවන්තොටුපළකට ලඟාවීමට පෙර, කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත පදනම්ව ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයකට යටත්ව එවැනි භාණ්ඩ ආනයනය කරන දේශීය නිෂ්පාදනකරුවන්

(ඈ) 2022 ජූලි 01 සිට 2022 අගෝස්තු 31 දක්වා කාලය තුළ, මෙම රෙගුලාසිවල I උපලේඛනයේ දක්වා ඇති අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය (භාණ්ඩ), එම භාණ්ඩ ශ්‍රී ලංකාවේ වරායට / ගුවන් තොටුපළ වෙත පැමිණීමට පෙර වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලබාගන්නා ලද නිර්දේශයට යටත්ව, ආනයනය කරන ආනයනකරුවන් සඳහා පමණක් වේ.

ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම රෙගුලාසිය (4(ඈ)) යටතේ භාණ්ඩ ආනයනය පිළිබඳ විස්තර (ආනයනකරුවන්ගේ / භාණ්ඩ ලද අයගේ නම්, භාණ්ඩවල එච් එස් කේත සහ විස්තරය, ආනයනික ප්‍රමාණ සහ මි.ර.ගැ අගය) සෑම සතියකම සඳුදා දින වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලබාදිය යුතුය.

4. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත සපයන ලද අපනයනකරුවන්ගේ විස්තර පදනම් කරගෙන ඉහතින් සංශෝධනය කරනු ලැබූ, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 4(අ) රෙගුලාසියේ විධිවිධානවලට යටත්වන අපනයනකරුවන්, එකී රෙගුලාසි වල අංක 5 සහ 6 රෙගුලාසි වලින් නිදහස් කරනු ලැබේ.

5. 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල, රෙගුලාසි අංක 4(ආ) හි දක්වා ඇති විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් එකක් හෝ කිහිපයක් අදාළ වක්‍ර අපනයනකරු විසින් පවත්වාගෙන යන බවට සහතික කරමින් ඔහුගේ බැංකු (ව) කාර්තුමය ලෙස ලබාදෙන පිටසන් කිරීම් ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම මත පදනම්ව, ඉහතින් සංශෝධනය කරනු ලැබූ 2022 මැයි 06 දිනැති අංක 2278/21 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 4(ආ) රෙගුලාසියේ විධිවිධානවලට ගැනෙන වක්‍ර අපනයනකරුවෙකු, එකී රෙගුලාසි වල අංක 5 සහ 6 දරන රෙගුලාසිවලින් නිදහස් කරනු ලැබේ.

6. මෙම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත හා බලපත්‍රලාභී බැංකු වෙත සුදුසු "මෙහෙයුම් උපදෙස්" නිකුත් කළ යුතුය.

7. ඉහත රෙගුලාසි වලට පටහැනිවන ලෙස ආනයනයන් සිදුකර ඇති විටදී රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් රේගු ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඉහතින් සංශෝධනය කරන ලද, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 4(ඇ) රෙගුලාසිය උල්ලංඝනය කරමින් කරන ලද යම් ආනයනයක් සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරයා විමසිය යුතුය.

## I උපලේඛනය

| | *I තීරුව ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම සඳහා අවසර ඇත (OAP)* |
|---|---|---|---|---|---|
| 1 | **03.05** | | | **වියළි, ලුණු දැමූ හෝ ලුණු දියරෙහි දැමූ, මසුන්; දුම් ගැසීමේ ක්‍රියාවලියේදී හෝ එයට පෙර පිසින ලද හෝ නොලද, දුම් ගැසූ මසුන්; මනුෂ්‍ය ආහාරයට සුදුසු මසුන්ගේ, පිටි, ඇඹරුම් පිටි සහ ගුලි.** | |
| | | 0305.54.00 | -- | හුරුල්ලන් (ක්ලුපියා හැරින්ගස්, ක්ලුපියා පැලසි), ඇන්කෝවීස් (එන්ග්‍රාව්ලස් විශේෂ), සාඩින් (සාඩිනා පිල්චාඩුස්, සාඩිනොප්ස් විශේෂ), සාඩිනෙල්ලා (සාඩිනෙල්ලා විශේෂ), බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් (ස්ප්‍රැට්ටුස් ස්ප්‍රැට්ටුස්), මැකරල් (ස්කෝම්බ ස්කොම්බ්‍රස්, ස්කෝම්බ ඔස්ට්‍රලාසිසිස්, ස්කෝම්බ ජැපොනිකස්), ඉන්දියානු මැකරල් (රස්ට්‍රලේලිජර් විශේෂ), තෝරා මසුන් (ස්කොම්බරෝමොරස්), ජැක් සහ හෝර්ස් මැකරල් (ට්‍රචුරුස් විශේෂ), ජැක්ස්, ක්‍රෙවලස් (කාරනක්ස් විශේෂ) කෝබියා (රාචයිසේන්ට්‍රන් කැනඩමම්), සිල්වර් පොම්ප්‍රෙරෙට්ස් (පැම්පස් විශේෂ), පැසිපික් සැවුරි (කොලෝලැබිස් සෙයිරා), ස්කැඩ්ස් (ඩිකැප්ටරස් විශේෂ), කැපෙලින් (මැලෝටස් විලෝසස්), කඩකොප්පරා මසුන් (එක්ස්පියස් ග්ලැඩිස්), කවකාවා (ඉයුතිනස් ඇෆිනිස්), බොනිටොස් (සාර්ඩා විශේෂ), මාලින්ස්, තලපත් මසුන්, ස්පියර් මසුන් (ඉස්ටිඕපොරිඩේ) | |
| | | 0305.54.10 | --- | හාල්මැස්සන් | OAP |
| | | | | | |
| 2 | **04.02** | | | **සීනි හෝ වෙනත් රසකාරක අඩංගු කළ, හෝ සාන්ද්‍ර කළ කිරි සහ යොදය.** | |
| | | | - | අඩංගු මේද ප්‍රමාණය මුළු බරින් 1.5% ට නොවැඩි, පිටි, කැට හෝ වෙනත් ඝන ස්වරූපයෙන් වූ : | |

| | I තීරුව ශීර්ෂ අංකය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව විවෘත ගිණුම් / භාණ්ඩ විකිනීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම සඳහා අවසර ඇත (OAP) |
|---|---|---|---|---|---|
| | | 0402.21.00 | -- | සීනි හෝ වෙනත් රසකාරක අඩංගු නොකළ | OAP |
| | | | | | |
| 3 | **07.01** | | | **අර්තාපල්, අළුත් හෝ ශීතකළ.** | |
| | | 0701.90.00 | - | අනෙකුත් | OAP |
| | | | | | |
| 4 | **07.03** | | | **ලූනු, ෂැලොට්, සුදු ලූනු, ලීක්ස් සහ අනෙකුත් ලූනු කුලයේ එළවළු වර්ග, අළුත් හෝ ශීතකළ.** | |
| | | 0703.10.00 | - | ලූනු සහ ෂැලොට්: | |
| | | 0703.10.20 | --- | බොම්බයි ලූනු | OAP |
| | | | | | |
| 5 | **07.13** | | | **පිටි, කුරුට්ට ඉවත් කළ හෝ නොකළ පියලි කළ හෝ නොකළ හෝ පොතු ගැලවූ වියළි රනිල එළවළු (+).** | |
| | | 0713.10.00 | - | මෑ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | |
| | | 0713.10.20 | --- | පියලි කළ | OAP |
| | | 0713.40.00 | - | පරිප්පු (ලෙන්ටිල්ස්) ; | |
| | | | --- | මයිසූර් පරිප්පු (රතු පරිප්පු), සම්පූර්ණ හෝ පියලි කළ ; | |
| | | 0713.40.11 | ---- | සම්පූර්ණ | OAP |
| | | | | | |
| 6 | **09.04** | | | **"පයිපර්" ගණයේ ගම්මිරිස්, කැප්සිකම් ගණයේ හෝ පිමෙන්ටා ගණයේ වියළි හෝ කුඩු කළ හෝ ඇඹරූ ගෙඩි.** | |
| | | | - | කැප්සිකම් හෝ පිමෙන්ටා ගණයේ පලතුරු: | |
| | | 0904.21.00 | -- | වියළි, කුඩු නොකල හා නොඇඹරූ ; | |
| | | 0904.21.10 | --- | මිරිස් | OAP |
| | | | | | |
| 7 | **10.06** | | | **සහල්.** | |
| | | | --- | කැකුළු සහල්: | |
| | | 1006.30.19 | ---- | වෙනත් (කැකුළු) | OAP |
| | | | --- | තම්බන ලද සහල් | |
| | | 1006.30.29 | ---- | වෙනත් (නාඩු සහ සම්බා) | OAP |
| | | | | | |
| 8 | **11.01** | | | **තිරිඟු හෝ මෙස්ලින් පිටි:** | |
| | | 1101.00.10 | --- | තිරිඟුවලින් | OAP |
| | | | | | |

| | I<br>තීරුව<br>ශීර්ෂ<br>අංකය | II තීරුව<br>සංයෝජිත<br>වර්ගීකරණ<br>සංකේතය | | III තීරුව<br>විස්තරය | IV තීරුව<br>විවෘත ගිණුම් / භාණ්ඩ<br>විකිනීමෙන් පසු<br>මුදල් ගෙවීමේ පදනම සඳහා<br>අවසර ඇත (OAP) |
|---|---|---|---|---|---|
| 9 | **17.01** | | | **ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස් (+).** | |
| | | 1701.99.00 | -- | අනෙකුත් : | |
| | | 1701.99.10 | --- | 99.70 ට වඩා වැඩි හෝ සමාන ධ්‍රැවීය අගයක් සහිත (ICUMSA අගය <=60) උක් සීනි | OAP |